## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට පාර්තෝෂික වෙන් කිරීම රු. 31,913,642 ක් වුවද ඒ වෙනුවෙන් පැවති නිදන් අරමුදල් ආයෝජන ගිණුමේ ශේෂය රු. මිලියන 5ක් පමණක් වූයෙන් ගිණුම්කරණ ප්‍රමිත 16 අනුව පාර්තෝෂික වෙන් කිරීමට අනුරූපව නිදන් අරමුදල පවත්වාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) සභාවේ සමහර ස්ථාවර වත්කම් වල ක්ෂය අනුපාතය තීරණය කිරීමේ දී ගිණුම්කරණ ප්‍රමිත 18 අනුව ඵලදායි ජීවිත කාලය,සුන්බුන් අගය, පිරිවැය යනාදිය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට එරෙහිව හා සභාව විසින් විවිධ කරුණු සම්බන්ධව අධිකරණවල නඩු 648 ක් පවරා තිබුණු අතර එයින් නඩු 104 ක් විසඳා තිබුණි. නමුත් ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව ඉතිරි නඩු 544 සම්බන්ධයෙන් වු අසම්භාව්‍ය බැරකම් පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ගිණුම්කරණ ප්‍රමිත 40 අනුව කොමිෂන් සභාව විසින් අත්පත් කරගෙන ඇති ඉඩම්, ආයෝජන දේපල ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව සතු ඉඩම් අක්කර 546,141 හි වටිනාකම රු. 676,169,345 ක් වශයෙන් දක්වා තිබුණ නමුත් මෙම ඉඩම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් හෝ ඉඩම් ලේඛනයක් සභාව සතුව නොතිබුණි. මීට අමතරව 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 472,039,446 ක් වූ ඉඩම් විකුණුම් ආදායමට අදාල පිරිවැය සම්බන්ධයෙන් ගිණුම් වලට ගැලපීම් කර නොතිබුණ අතර, ඊට අදාල ඉඩම් ප්‍රමාණය සම්බන්ධ තොරතුරු කිසිවක්ද විගණනයට ඉදිරිපත් නොවීය. මේ අනුව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ඉඩම් වල වටිනාකම නිවරද්‍යතාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) ගිණුම්කරණ ප්‍රමිත 41 අනුව සභාව විසින් එහි වත්කම් ඒවායේ නැවත අයකරගත හැකි වටිනාකමට වඩා නොවැඩි වටිනාකමකට පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය කරන ගිණුම්කරණ පිළිවෙත් අනුගමනය කර ඇත්ද යන්න ගිණුම් වලින් අනාවරණය කර නොතිබුණි.

## 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආදායම හඳුනාගැනීම, ආදායම් ගිණුම්කරණය සම්බන්ධ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) තොග අගය කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) කල්බදු ගිවිසුම් යටතේ දෙන ලද ඉඩම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුලත් ලේඛනයක් සකස් කර නොතිබුණි.

(ඈ) ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කළ මූලික පදනම එනම් මුදල් පදනම හෝ උපචිත පදනමද යන්න ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රධාන කාර්යාලයට අයත් ලිපිද්‍රව්‍ය තොග, සමීක්ෂණ ලේඛණ වල සඳහන් වටිනාකම හා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම් අතර වෙනස්කම් නිරීක්ෂණය වු අතර ඒ හේතුවෙන් ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 327,706 ක් ගිණුම් වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කල්බදු ගිණුම රු. 235,993 ක් ද, කල්බදු අවිනිශ්චිත පොලී ගිණුම රු. 14,893 ක් ද වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉඩම් විකුණුම් ආදායම රු. 213,280 ක් වැඩියෙන් ද කුඹුරු ඉඩම් විකුණුම් ආදායම රු. 245,400 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඈ) පරිපාලන ගාස්තු ආදායම හා සංචිත ලෙස රඳවා ගත් ආදායම පොදු ලෙජරයට පිටපත් කිරීමේදී රු. 31,620 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් බදුදීමෙන් අයවිය යුතු බදු කලි රු 8,115,169 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ නොපියවූ අත්තිකාරම් රු. 131,500 ක් වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන කාර්යාලයය ගොඩනැගිලි කුලී ලිපිගොනුව අනුව 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කුලිය රු. 35,803,000/- ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු. 10,680,000 ක් වශයෙන් දක්වා තිබුණි. ගොඩනැගිලි කුලී අඩුවෙන් තක්සේරු කිරීම මත 2009 වර්ෂයට අදාල ගිණුම්ගත කර නොතිබුණු රු. 600,000 ක් වූ ගොඩනැගිලි කුලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදීද ගැලපීම් කර නොතිබුණි.

(ඌ) 2008 වර්ෂයේ මිලදී ගෙන තිබු රු. 1,402,040 ක පරිගණක හා මෘදුකාංග,කාර්යාල උපකරණ යටතේ ගිණුම් ගත කර තිබීම නිවැරදි කිරීමේදී ඒ සඳහා රු. 166,319 ක් වූ ක්ෂය ප්‍රතිපාදනය සඳහා ගැලපීම් සිදු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ අඩමාණ ණය සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුණු අතර 2010 දෙසැම්බර් 31 දිනට අඩමාණ ණය වෙන්කිරීමේ ශේෂය රු. 8,270,356 ක් වූයෙන් එය ණයගැති ශේෂයන්ගේ මුළු එකතුවෙන් 0.4% ක් විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) වසර 9 කට වැඩි කාලයක් තිස්සේ පවතින විවිධ ණයගැති ශේෂයන් හා ආයතන 9කින් අය විය යුතු එකතුව රු.2,140,531,267 ක ණය ශේෂයන් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) ණයගැති ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය අනුව රජය සතු ආයතන වලින් රු.2,071,113,696 ක් ද වෙනත් විවිධ පාර්ශවයන්ගෙන් රු.2,921,575 ක් ද වර්ෂ 11 කට අධික කාලයක් තිස්සේ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජංගම වත්කම් වලින් රු. 2,140,531,267 ක් හෙවත් 94% ක් ලැබිය යුතු ණය ශේෂයන්ගෙන් සමන්විත වූ අතර එය මුළු වත්කම් වලින් 63% ක අගයක් ගෙන තිබුණි. 2008 නොවැම්බර් මස පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී හා 2009 වර්ෂයේ විගණන වාර්තාවෙන්ද ලැබිය යුතු මුදල් අයකර ගැනීමට සභාව විසින් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව විමසුම් කර ඇතත් එම ශේෂයන් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

### 1.2.5 නිරවුල් නොකළ ශේෂ

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදියර I හා අදියර II යටතේ වර්ෂ 18 ට වැඩි කාලයක සිට පවත්වාගෙන එනු ලබන වන්දි අවිනිශ්චිත ගිණුම්වල නිරවුල් නොකළ ශේෂයන්ගේ එකතුව රු.248,096,381 ක් විය.

(ආ) 2004 ජුලි 22 දිනැති අංක සීඑස්/සීපී/26/2004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඉඩම් පවරා දීම් තහනම් කර තිබූ හෙයින් ඉඩම් පවරා දීම වෙනුවෙන් පුද්ගලයින් 470 දෙනෙකු ගෙන් ලබාගත් රු. 13,217,292 වූ අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුයෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය/ සත්‍යාපනය කළ නොහැකි විය.

| ගිණුම් විෂය | ශේෂය | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ණයගැතියන් | 2,140,614,380 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) ස්ථාවර වත්කම් විෂයයන් 6 ක් | 727,397,965 | සමීක්ෂණ මණ්ඩල වාර්තා, ඉඩම් ලේඛන, ගොඩනැගිලි ලේඛන හා විස්තරාත්මක උපලේඛන |
| (ඇ) වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු වියදම් | 101,770,631 | වයස් විශ්ලේෂණ විස්තරාත්මක උපලේඛන |
| (ඈ) මෝටර් රථ අළුත්වැඩියා වියදම් | 4,377,171 | රු. 3,645,120 ක් වු අළුත්වැඩියා වලට අදාල මිල විමසීමේ හා මිල කියුම් ලිපි. |
| (ඉ) වන්දි අවිනිශ්චිත ගිණුම | 248,096,381 | ශේෂය සකස් වූ ආකාරය පිළිබඳ විස්තර |
| (ඊ) දැව විකිණීම | 56,222 | දැව තක්සේරු කිරීමට අදාල ලිඛිත සාක්ෂි |

(උ) සභාවේ ආරක්ෂක සේවාව සඳහා සැපයුම්කරුවෙකු තොරා ගැනීමේදී අවම මිල ගණන් ඉදිරිපත් කරතිබූ ආයතන දෙකක මිල ගණන් සේවාව දුර්වල ලෙස සලකා ඉවත් කර තිබූ නමුත් ඒ සඳහා ලබාගත් කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුනි.

**1.2.7 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>1971 අංක 38 දරන මුදල් පනත</u> | |
| (I) මුදල් පනතේ 11 වන ඡේදය හා 2004 අගොස්තු 10 දිනැත අංක පීඊඩී 25 (1) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රු. 404,388,972 ආයෝජන සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (II) මුදල් පනතේ 13(8) වගන්තියේ 7 උපවගන්තිය | 2009 වර්ෂයේ 13 (7) (අ) විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් සාකච්ඡාවට භාජනය කර, ගනු ලැබූ පියවර පිළිබඳ විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබුණි. |
| (ආ) <u>රජයේ මුදල් රෙගුලාස</u> | |
| (I) මු.රෙ. 371 (2) | සමාලෝචිත වර්ෂයේදී රු. 1,125,247 ක අත්තිකාරම් මුදල් මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරින්ට ලබාදී තිබුණි. |
| (II) මු.රෙ. 1646 | වාහන 14 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් හා මාසික සාරාංශ කාලානුරූපීව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (III) මු.රෙ. 502 (2) | එක් එක් ස්ථාවර වත්කම් විෂයට අදාලව එහි පිරිවැය,හැඳින්වීම,අත්පත් කර ගත් දිනය,වාර්ෂික ක්ෂය අනුපාතය,පිහිටීම වැනි තොරතුරු ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ

-----------

(I) භාණ්ඩාගාර චක්‍රලේඛ

----------------------

| | |
|---|---|
| I 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | I. චක්‍රලේඛ විධිවිධාන වලට පරබාහිර ලෙස කොමිෂන් සභාව විසින් සභාපති හා වැඩබලන විධායක අධ්‍යක්ෂවරයා සඳහා පිළිවෙලින් රු. 2000 සහ රු. 1500 බැගින් වූ ආහාර හා නවාතැන් දීමනා අනුමත කර තිබුණි.<br><br>II. 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව විධායක අධ්‍යක්ෂවරයෙකුට මසකට ඩීසල් ලීටර් 190 ක උපරිමයකට යටත්ව ඉන්ධන ලබාගත හැකි නමුත්, සභාවේ වැඩබලන විධායක අධ්‍යක්ෂවරයා විසින් මෙම සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව ඉන්ධන ලීටර් 2754 ක් භාවිතා කර තිබුණු අතර, ඒ සඳහා සභාව විසින් දරන ලද අමතර වියදම රු. 243,199 ක් විය. |

(II) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

----------------------------

| | |
|---|---|
| I 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1(6) ජේදය | නියැදි පරීක්ෂාවට අනුව සභාවේ තාවකාලික පදනමට පත්කරනු ලැබ ඇති ඔප්පු උපදේශකවරයාට නිල වාහන පහසුකම් ලබා ගත නොහැකි වුවත් ඔහු විසින් නිවසට යාම ඒම සඳහා වාහනයක් යොදවා ගෙන 2010 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා ඉන්ධන ලීටර් 1820.54 ක් භාවිතා කර තිබුණු අතර ඒ වෙනුවෙන් වූ වියදම රු. 132,900 ක් විය.<br><br>මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් පහත සඳහන් පරිද වාර්තා කර තිබුණි. |

| | |
|---|---|
| | "අනුමත සීමාවෙන් බැහැරව ඇති ඉන්ධන ප්‍රමාණයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසට අදාල අංශ දැනුවත් කරන ලදී." |
| II 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන චක්‍රලේඛයේ 2.3.1 වගන්තිය | බැහැර කිරීම සඳහාවූ වත්කම් තක්සේරු කොට ඒවාට අවම ලංසු නියම කිරීම සඳහා තක්සේරු මණ්ඩලයක් පත්කරනු ලැබිය යුතු අතර ඒ සඳහා අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. තක්සේරු මණ්ඩලය සඳහා ඉංජිනේරුවරයෙක් / කාර්මික නිලධාරියෙක් සහ වඩාත් යෝග්‍ය පරිදි තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් හෝ යටත් පිරිසෙයින් ගණකාධිකාරීවරයෙකුගෙන් සමන්විත විය යුතු වුවත් නාරංගල වත්ත තේ කර්මාන්තශාලාවේ රු. 1,900,000 ක් වූ වෙළඳපල තක්සේරුව සඳහා එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුනි. |
| III 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02.I වගන්තිය | ආයතන ප්‍රධානින් ඇතුළු සියළුම රාජ්‍ය සේවකයන් තම පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීම් යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත් සභාවේ වැඩ බලන විධායක අධ්‍යක්ෂවරයා හා පැවරුම් පදනමක් මත පත්කර ඇති ඔප්පු උපදේශකවරයා ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. |
| IV 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛය | වැඩබලන විධායක අධ්‍යක්ෂවරයා සිය නිල වාහනයට අමතරව සංචිත වාහනද භාවිතා කර තිබුණි. |

(III) ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ

----------------------------------------

| | |
|---|---|
| 1995 ජූලි 21 දිනැති අංක SEI/A/4/34 දරන චක්‍රලේඛයේ 8 (ඇ) වගන්තිය | බදුකරුවන් බදු ගිවිසුම අනුව බදු ගෙවීම පැහැර හැරිය හොත් ස්වයංක්‍රියවම බදු ගිවිසුම අවසාන වන බවත් ඊට අදාලව බදු ගිවිසුම අවලංග කර යුතු බවත් දන්වා තිබුණද, පෞද්ගලික සමාගමක් 1993 ඔක්තෝබර් මාසයේ සිට 2005 වර්ෂය දක්වා බදු ගෙවීම පැහැර හැර ඇතත් ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ පනත (ඇ) වගන්තිය | ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක යෙදී සිටින ඕනෑම තැනැත්තෙකුගෙන් ජාතිය ගොඩනැගීමේ පනත ප්‍රකාරව බදු අයකළ යුතු වුවද සභාව විසින් මෙම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) <u>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u> | |
| I. 9.3.1 (ආ) වගන්තිය | රු. 100,000 කට වැඩි අළුත්වැඩියා කිරීම සඳහා රේඛිය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් අවස්ථා 4 කදී රු. 1,289,309 ක් දරා සිදු කරන ලද වාහන අළුත්වැඩියාවන් සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ඊ) <u>ආයතන සංග්‍රහය</u> | |
| II වන පරිච්ඡේදයේ 13.3 වන වගන්තිය | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලැබෙන තෙක් පමණක් වුවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිළධාරින් තිදෙනකුගේ වැඩ බැලීමේ කාලය වර්ෂ 3 ඉක්මවා තිබූ අතර වැඩ බැලීමේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේද රු. 230,760 ක් ගෙවා තිබුණි.අදාල තනතුරු සඳහා අයදුම්පත් කැඳවූ නමුත් තනතුරට අදාල වැටුප් තලයට සේවය කිරීමට අකමැත්ත පල කරන බැවින් බඳවා ගැනීමේ කාර්යයන් අසාර්ථක වූ බව සභාපතිවරයා පිළිතරු වශයෙන් දැනුම් දී ඇත. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

--------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

(අ) ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවල ශුද්ධ අතිරික්තය රු. 10,221,761 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,585,948 ක් වුයෙන් අතිරික්තයේ අඩුවීම රු. 12,364,187 ක් හෙවත් 55% ක විය.සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සැසඳීමේදී වෙනත් මෙහෙයුම් ආදායම (ස්ථාවර තැන්පතු) රු.මිලියන 50.3 සිට රු.මිලියන 36.9 දක්වා අඩුවීමත් පරිපාලන වියදම් රු.මි 141.4 සිට 154.8 දක්වා වැඩිවීම හා අනෙකුත් මෙහෙයුම් වියදම් රු.මි 3.4 සිට 5.5 දක්වා වැඩිවීම අතිරික්තය අඩුවීමට හේතු වී තිබුණි.

(ආ) කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපු පසු මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි 50% ක අඩුවීමක් නිරීක්ෂණය විය.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

-------------------------

#### 2.2.1 කාර්ය සාධනය

---------------

(අ) ක්‍රියාත්මක සැලැස්ම අනුව ඉලක්කය සහ ඉටුකරගත් ප්‍රගතිය දැක්වෙන ආකාරයට කාර්‍යය සාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2010 ක්‍රියාත්මක සැලැස්මෙහි අඩංගු ක්‍රියාකාරකම් 04 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මෙහි අඩංගු ක්‍රියාකාරකම් 09 ක් සම්බන්ධයෙන් කාර්ය සාධනය ඉටු නොවීමේ ප්‍රතිශතය 54% - 83% වැනි ඉහළ පරාසයක තිබූ හෙයින් ක්‍රියාත්මක සැලැස්මෙහි අරමුණු නිසි අයුරින් ඉටු වී නොමැති බවත් නිරීක්ෂණය විය.

## 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) කොමිෂන් සභා තීරණයක් මත සේවක සුභසාධනය අරමුණු කරගෙන සහා සේවකයන් සඳහා ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙලක් හඳුන්වාදී තිබුණු අතර වර්ෂ 4 කට වඩා අධික කාලයක් ගතවී ඇතත් ඉඩම් විකිණීම සඳහා ඔවුන්ගෙන් ලබා ගත් රු. 3,584,600 ක අත්තිකාරම් මුදල් සඳහා ඉඩම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවේ බැංකු ජංගම ගිණුම් වල විශාල මුදල් ප්‍රමාණයක් නිශ්ක්‍රීයව පැවති බවත් එකී අවස්ථාවල රු.මිලියන 20 ට වැඩි මුදලක් මාස 3 කට වැඩිකාලයක් නිශ්ක්‍රීයව පැවති බවත් විගණනයේදී නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් එම මුදල් කාර්යක්ෂමව ආයෝජනය කර උපයාගත හැකිව තිබු පොලී ආදායම් අහිමිවී තිබුණි.

(ඇ) 2007 ජුනි මාසයේ සිට කොමිෂන් සභා අනුමැතියෙන් පැවරුම් පදනමක් මත මාස 3 ක කාලයක් සඳහා ඔප්පු අංශයේ උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණි. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා බඳවා නොගන්නා ලෙස දන්වා තිබුණද 2009 දෙසැම්බර් මාසයේ සිට 2011 ජුනි මාසය දක්වා ඔහුගේ සේවය වරින් වර දීර්ඝ කර තිබුණි. මෙම නිලධාරියාගේ සුදුසුකම් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත්ව නොතිබු අතර බඳවාගැනීමේ කොන්දේසි ප්‍රකාරව ඔහු විසින් සිය රාජකාරී සම්බන්ධව මාසික වාර්තාවන්ද ඉදිරිපත් කර නොතිබුණි. තවද විගණනයට ඉදිරිපත් වු වාහන ධාවන සටහන් වල තොරතුරු අනුව, ඔහු සඳහා ඉන්ධන වෙනුවෙන් වැයකර තිබු මුදල රු. 273,650 ක් විය.

(ඈ) කටයුතු අවසන් හා අවසන් නොවූ ලිපිගොනු රාශියක් ලේඛනාගාරයේ අක්‍රමවත් ආකාරයට ගබඩා කර තැබීම හේතුවෙන් සභාවේ ලිපිගොනු අස්ථානගතවීමේ අවදානමක් පැවතුණි.

(ඉ) අංක 53-9673 දරන වාහනය අළුත්වැඩියා කටයුතු සඳහා භාර දුන් පසු ගරාජය විසින් කි.මී. 274 ක් ධාවනය කර තිබුණු බව රියදුරු විසින් ධාවන සටහන් පතෙහි සඳහන් කර තිබුණද සභාව විසින් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පණත අනුව කොමිෂන් සභාව එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් රු. 16,712,517 ක් වූ විශාල බදු මුදලක් රජයට අහිමි වී තිබුණි.

මේ සම්බනධයෙන් සභාපතිවරයා විසින් පහත සඳහන් අන්දමට මා වෙත වාර්තා කර තිබුණි.

"කොමිෂන් සභාව ලාභ ඉපයීම ප්‍රධාන අරමුණු කර නොගත් ආයතනයක් වන අතර, මෙමඟින් ඉඩම් ලබා දෙනුයේ වැඩි වශයෙන් අසරණ හා දුප්පත් ජනතාව වෙනුවෙනි. වක්‍රාකාරයෙන් බැලූ විට මෙම බදු මුදල් අය කරන්නේ නම් එය අය කර ගත යුත්තේද, සාමාන්‍ය ජනතාවගෙන්මය. ඒ නිසා එය දුෂ්කර කාර්යයක්ව පවතී".

## 2.2.3 හඳුනාගන්නා ලද පාඩු

පරිගණක මෘදුකාංග පැකේජයක් ලබා ගැනීම වෙනුවෙන් 2007 වර්ෂයේදී ගෙවූ රු. 1,700,000 ක මුදලක් 2010 දෙසැම්බර් 31 දක්වාත් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර තිබුණි. මෙම ගෙවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් පැවැතවෙන බව විගණනයේදී අනාවරණය වු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල කිසිදු හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

## 2.2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) දිස්ත්‍රික් කාර්යාල 6 කට අයත් ඉඩම් පිළිබඳ සකස් කළ ලේඛන සමාලෝචනයේද, තොරතුරු සොයාගත නොහැකි ඉඩම්, පවරා ගෙන නොමැති ඉඩම්, වර්තමාන විස්තර නොමැති ඉඩම් වශයෙන් විවිධ ගැටළු සහිත ඉඩම් කැබලි 869 ක් නිරීක්ෂණය විය.

**(ආ) 1998 වර්ෂයේද මිනුවන්ගොඩ වල්ජාපාල වත්ත කර්මාන්ත පුරයක් සඳහා බදුදීම.**

කර්මාන්ත 13 ක් වෙනුවෙන් අක්කර 15 රූඩ් 1 පර්චස් 4 ක් කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා දී තිබු අතර ඒ පිළබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. බදු දුන් ඉඩම් ප්‍රමාණය රූඩ් 1 පර්චස් 33 ක් අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් එක් ආයතනයකින් අඩුවෙන් බදු මුදල් අයකරමින් තිබුණි.

II. ආයතන දෙකකින් බදු මුදල් අයකරගෙන නොතිබුණ අතර අමාත්‍යාංශයෙන් භුක්තිය භාරදුන් දිනයක් ලිඛිතව ලබාගෙන එම දිනයේ සිට බදු ගිවිසුමට එළඹ මුදල් අයකිරීමට කටයුතු කරන බව සභාපතිවරයා 2011 මාර්තු මාසයේදී මා වෙත දන්වා තිබුණි.

III. එක් සමාගමකින් අයවිය යුතුව තිබුණු බදු ආදායම රු. 211,688 ක් වූ අතර සමාගම් 2 ක් බදු මුදල් ගෙවීම පැහැර හැර තිබු නමුත් අධිභාර මුදල් අයකරගෙන නොතබුණි අධිභාර අයකිරීම කොමිෂන් සභාවේ පටිපාටියක් ලෙස ක්‍රියාත්මක වුවද, බදු ගිවිසුමක එවැනි කොන්දේසියක් ඇතුලත් කර නොමැති අවස්ථා වලදී අධිභාර අයකර ගැනීම ගැටළු සහගත බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

IV. ඉඩම් කොටස් 4 ක බදු මුදල් සංශෝධනය විය යුතුව පැවති අතර, මේ හේතුව නිසා සභාවට අයවිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි. සංශෝධනය කර අය කර ගැනීමට ක්‍රියා කරමින් පවතින බව සභාපතිවරයා දක්වා තිබුණි.

(ඇ) **මීරිගම බටගොල්ල වත්ත හා රෑනගල වත්ත**

**-----------------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. 2004 ජනවාරි මාසයේ මෙම ඉඩමේ අක්කර 50 පර්චස් 26 ක් වැවිලි සමාගමක් වෙත බදු දී තිබුණද, එහි අක්කර 02 පර්චස් 26 ක බිම් ප්‍රමාණයක් සඳහා බදු මුදල් අයකර නොතිබුණි. නිත්‍යානුකූලව භුක්තිය භාරදී නොමැති නිසාත් සංවර්ධනයක් හෝ පරිහරණයක් වන තෙක් එම ඉඩම් කොටසට අදාලව හිඟ මදල් අයකර ගැනීමේ නීතීමය හැකියාවක් නොමැති බව සභාපතිවරයා 2011 පෙබරවාරි මාසයේදී මා වෙත දන්වා තිබුණි.

II. 2009 මාර්තු මාසයේ සිට 2010 මාර්තු මාසය දක්වා එම වැවිලි සමාගම විසින් රු. 369,600 ක බදු මුදල් ගෙවීම පැහැර හැර තිබු අතර 2009 මාර්තු මාසය දක්වා අය නොකළ අධිභාර මුදල රු. 6,100 ක් විය.

III. රු. 52,222 කට තක්සේරු කරන ලද ඉඩමක තිබු දැව 2005 වර්ෂයේදී රු. 34,000 ක මුදලකට බදුකරුටම විකුණා තිබුණු අතර, වෙන්දේසි මණ්ඩල සාමාජිකයෙකු ලෙස බදුකරු ද කටයුතු කර තිබුණි.ගණුදෙනුව විවෘතව හා නිවැරදිව සිදුවී නොමැති බව පිළිගන්නා බවත් එවැනි තත්වයන් ඇති නොවීමට පියවර ගෙන ඇති බවත් 2011 පෙබරවාරි මාසයේදී සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ඈ) **ජොන්ස්ලන්ඩ් වත්ත ඉඩම**

--------------------------------

ගම්පහ දිස්ත්‍රික් බල මණ්ඩලයට අයත් මෙම ඉඩම 2009 අගෝස්තු මාසයේ සිට පවරා තිබුණු අතර, 2009-2013 කාලය සඳහා බදු මුදල රු. 1,930,500 ක් විය. 2009 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් මාසය වන විට අයකරගතයුතු බදු මුදල අධිභාරය සමඟ රු. 810,810 ක් බව විගණනයේදී අනාවරණය විය.

(ඉ) **බෝතලේ වත්ත ඉඩම**

----------------------------

අක්කර 05 පර්චස් 29 ක බිම් ප්‍රමාණයක් 1998 වර්ෂයේ සිට බදු දී තිබුණු අතර, 2003- 2008 වර්ෂ සඳහා වාර්ෂික බදු කුලිය රු. 6075 ක් විය. 2010 වර්ෂයේ සිට නව බදු ගිවිසුමක් සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු මගින් තක්සේරු වටිනාකම ලබා ගත් පසු බදු මුදල් සංශෝධනයන් සිදු කරනු ලබන බවත් සභාපතිවරයා මාවෙත දන්වා තිබුණි.

**2.2.5 සංයුක්ත සැලැස්ම**

------------------

2011 -2015 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මට අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී 2005 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දැක්වූ අතිරික්තය සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(ඇ) ඉදිරිපත් කර ඇති සංයුක්ත සැලැස්ම 2011-2015 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කර ඇති බව දක්වා ඇතත් , සංයුක්ත සැලැස්මේ 2013- 2015 වර්ෂ සඳහා ආදායම හා වියදම පුරෝකථනය කර නොතිබුණි.

(ඇ) එක් එක් වර්ෂය තුළදී ළඟාකර ගැනීමට අපේක්ෂිත භෞතික හා මූල්‍ය ඉලක්කයන් පිළිබඳ විස්තර සංයක්ත සැලැස්මෙන් පිළිබිඹු නොවන කර්තව්‍යයන් 10 ක් සංයුක්ත සැලැස්මට ඇතුලත් කර තිබුණි. මේ අනුව 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය පරිදි සංයුක්ත සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.2.6 අයවැය පාලනය

----------------

ඇස්තමේන්තුගත අයවැය හා තථ්‍ය අයවැය අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.2.7 සේවක මණ්ඩල කළමනාකරණය

--------------------------------------

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 190 ක් වුවද 2010 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 412 ක් විය. ඒ අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව 231 ක් වූ අතර මෙම අතිරික්ත සේවකයන් සියළුදෙනා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනයකින් තොරව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව කොමිෂන් සභා තිරණයක් මත 2009 වර්ෂයේදී ස්ථිර කර තිබුණි. එසේ වුවත් 2011 අප්‍රේල් මාසය දක්වාත් ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර මේ හේතුවෙන් සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවූ සේවකයන් 231 ක් සඳහා වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 2.2.8 අභ්‍යන්තර විගණනය

----------------------

(අ) සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වුවද 2007 පෙබරවාරි මාසයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2010 වර්ෂය සඳහා මුදල් අංශ කටයුතු, ඉඩම් උපරිම සීමා අංශ කටයුතු, වාර්ෂික අයවැය ඇස්තමේන්තු නීති කටයුතු, ඉඩම් පැවරීමේ කටයුතු හා විගණකාධිපති වාර්තා කර ඇති අඩුපාඩු නිවැරදි කිරීමේ කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය මෙහෙයවීමට සැලසුම් කර තිබුණද සැලසුම් පරිදි එම කටයුතු සිදු කර නොතිබුණි.

### 2.2.9 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------

සභාව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවතින නමුත් එහි නියෝජිතයෙකු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල සාමාජිකයෙකු ලෙස සහභාගි වී නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩුද වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව සභාවේ විශේෂ අවධානය යොමු කළ යතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ස්ථාවර තැන්පතු පොලී ආදායම

(ඈ) ඉඩම් අංශ කටයුතු

(ඉ) වාහන පාලනය

(ඊ) ලේඛනාගාරය

(උ) ණයගැති ශේෂ අයකර ගැනීම

(ඌ) අත්තිකාරම් ලබා දීම

(එ) අතිරික්ත මුදල් ආයෝජනය කිරීම